# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2081/37 - 2018 ජූලි මස 25 වැනි බදාදා - 2018.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ වැලිමඩ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන වැලිමඩ ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ වැලිමඩ ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයකු ලෙස පත්වූ විජේසේකර මුදියන්සේලාගේ ගුණවර්ධන අයත් වන්නා වූ ජනතා විමුක්ති පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම වැලිමඩ ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා දිසානායක මුදියන්සේලාගේ අජිත් කුමාර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි හතුරුසිංහලාගේ ඉන්දික රංජන් හතුරුසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් දිසානායක මුදියන්සේලාගේ අජිත් කුමාර, වැලිමඩ ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එච්. අයි. ආර්. හතුරුසිංහ,
තේරීම්භාර නිලධාරී,
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 24 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

08 - 397

1A - G 28169 — 17 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*